රජ්ගම ප්‍රාදේශිය සභාව

**ගාල්ල දිස්ත්‍රික්කය.**

01. **මූල්‍ය ප්‍රකාශන**

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 21 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 10 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතරඅතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 **මතය**

මෙම වාර්තාවේ සඳහන් ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති රජ්ගම ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2000 දෙසැම්බර් 15 දින අංක 1162/12 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් මගින් හික්කඩුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය හික්කඩුව නගර සභාව හා රජ්ගම ප්‍රාදේශීය සභාව වශයෙන් පළාත් පාලන බල මණ්ඩල දෙකක් බවට 2001 අප්‍රේල් 15 දින සිට ක්‍රියාත්මක වී තිබුණි. එසේ වුවද, හික්කඩුව ප්‍රාදේශීය සභාව සතුව තිබූ වත්කම් හා වගකීම් නිශ්චිත වශයෙන් බෙදා වෙන් කිරීමක් 2012 නොවැම්බර් 23 දින දක්වාම සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.5,969,579 ක අවිනිශ්චිත ගිණුම් බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ පළාත් සභා ප්‍රතිපාදන යටතේ කර්මාන්ත සඳහා ගෙවන ලද රු.3,182,494 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර තැන්පත් පොලී ආදායම් ලෙස රු.101,644 ක් දක්වා තිබණ ද, සභාව සතුව ස්ථාවර තැන්පතු නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. මේ අනුව රු.101,644 ක ව්‍යාජ පොලී ආදායමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.4,925,800 ක් වුවද, රු.7,700,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් රු.2,774,200 කින් සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ 03 ක සිට ඉදිරියට ගෙන එමින් පවතින නිලධාරීන් අතැති රු.516,670 ක් වූ සෘණ මුදල් ශේෂය හඳුනාගෙන නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට විගණන විමසුම් 09 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.19,136,681 ක් විය.

### (ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.68,136,058 ක් වූ වත්කම් හා වගකීම් ශේෂ විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,129,554 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,465,077 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසිසභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කරන තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් බදු | 526 | 869 | 846 |
| (ii) | බදුකුලී | 1,613 | 1,213 | 612 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 360 | 368 | 47 |
| (iv) | වෙනත් ආදායම් | 37,914 | 22,527 | 15,358 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 631,749 |
| (ii) | මුද්දර ගාස්තු | 3,494,580 |

### 2.2.3 රජ්ගම පොදු වෙළඳ සංකීර්ණය කඩ කාමර බදු දීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2000 වර්ෂය තුළදී කඩ කාමර 22 බදු දී තිබණ ද ඉන්පසුව ගිවිසුම් යාවත්කාලීන කර නොතිබණි.

(ආ) දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 26 දින අංක: දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 5 ජේදයට අනුව ගිවිසුම් වසර තුනකට වරක් යාවත්කාලීන කළයුතු වුවද, විගණන දිනය වූ 2012 ජුනි 25 දින වන විටත් ගිවිසුම් අලුත් කර නොතිබුණි.

---

(ඇ) අංක 05, 06, 07, 08, 14, 16, 17, 18, 19, 20, 21, 22 දරන කඩ කාමර බදුකරුවන්ගේ හිඟහිටි කුලිය රු. 480,815 ක් විය. 2011 මැයි 04 දින කඩ කාමර මුද්‍රා තබා තිබුණ ද, ඒවා නැවත බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වෙළදපොල ගොඩනැගිල්ලේ කඩ කාමර දොරවල් සහ විදුලි රැහැන් පද්ධතිය අබලන් තත්ත්වයේ පවතින බැවින් කුලියට දීම සඳහා ඒවා අළුත්වැඩියා කළයුතු වුවද, එසේ කර නොතිබුණි. වෙළදපොල ගොඩනැගිල්ල ඉදිරිපිට පරිශ්‍රයේ මාළු වෙළදාම කරනු ලබන බැවින් කඩ කාමරවල ව්‍යාපාරික කටයුතු කළ නොහැකි වුවද, එහි මාළු වෙළදාම වෙනත් ස්ථානයකට ගෙන යාමට කටයුතු කර නොතිබුණි. එමනිසා කඩ කාමර කුලියටදීම සාර්ථක වී නොතිබුණි.

(ඉ) රු.5,000,000 ක් වටිනා පොදු වෙළදපොල ගොඩනැගිල්ල බදු දීමට හැකි පරිදි සකස් නොකිරීම නිසා සභාව සතු සම්පත් නිසි පරිදි ආරක්ෂා කිරීම සිදු වී නොතිබුණු අතර, නිසි සම්පත් කළමනාකරණයක් නොතිබ බැවින් ලබා ගතහැකිව තිබූ කුලී ආදායම සභාවට අහිමිව තිබුණි.

## 2.3 මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා

---

### 2.3.1 බැංකු ගිණුම්

---

එක් බැංකු ජංගම ගිණුමකට අදාල බැංකු සැසඳුම් අවසාන වශයෙන් 2010 ජූලි මාසය සඳහා ද අනෙක් බැංකු ගිණුමේ 2010 දෙසැම්බර් මාසය දක්වා ද සකස් කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් දක්වා නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ රු. 308,165 ක් වටිනා චෙක්පත් 51 ක් සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කර නොතිබුණි.

### 2.3.2 කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය සහ පරිශ්‍රය

---

සභාවේ මොන්රෝවියාවත්ත කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියේ පොහොර නිෂ්පාදන කටයුතු සහ අවට පරිශ්‍රයේ වගාවන් සම්බන්ධ කටයුතුවල විගණන දිනය වූ 2012 ජූනි 25 දින වනවිට සේවකයන් හතර දෙනෙකු සේවයේ නිරතව සිටි අතර, 2011 වසර පුරා එක් අවස්ථාවකට සේවකයන් 04 දෙනෙකු වනසේ සේවකයන් 11 දෙනෙකු සේවය කර තිබුණි. මුරකරුට රු.212,904 ක් සහ අනෙකුත් සේවකයන්ට රු.553,055 ක් ලෙස එම කාලය තුළදී වැටුප් ලෙස රු.765,959 ක වියදමක් දරා තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොම්පෝස්ට් වැඩ බිමෙහි තිබ පැකට් කරන ලද පොහොර ප්‍රමාණය කි.ග්‍රෑ.1110 ක් වූ අතර නිෂ්පාදනය කර පැකට් කිරීම සඳහා තිබ පොහොර තොගය කි.ග්‍රෑම් 7000 ක් පමණ විය. නිශ්පාදන හා අලෙවි කිරීම් පිළිබඳ තොග පොතක් පවත්වා නොතිබ අතර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය වාර්තා කර නොතිබණි.

(ආ) වගාවන්ට යොදන ලද පොහොර ප්‍රමාණය පිළිබඳ වාර්තා තබාගෙන නොතිබණි.

(ඇ) කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය පරිශ්‍රයේ අවුරුදු 3 ක සිට අක්කර 1 ක පමණ ප්‍රමාණයක කෙසෙල් වගාවේ දළ වශයෙන් කෙසෙල් පඳුරු 250 ක් පමණ තිබණ ද 2011 වර්ෂය තුළදී කිසිදු ආදායමක් ලැබී නොතිබණි.

(ඈ) පඳුරු 3200 ක් පමණ ඇති අන්නාසි වගාවෙන් ද කිසිදු ආදායමක් 2011 වසර තුළදී ලැබී නොතිබණි.

(ඉ) කොම්පෝස්ට් ව්‍යාපෘති පරිශ්‍රයේ වගාවන්ට සොරුන්ගෙන් හානි වන බව වාර්තා වී තිබණ ද, 2011 වසර තුළ එහි මුරකරුට රු.212,904 ක වැටුප් ගෙවා තිබණි.

### 2.3.3 ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීම

සභා බලප්‍රදේශයේ ජලනල එලීම් සඳහා මාර්ග පළුදු කිරීම් වෙනුවෙන් ජාතික ජල සම්පාදන ජලාපවහන මණ්ඩලයෙන් 2011 වර්ෂය තුළදී රු.1,556,133 ක ගාස්තු අය කරගෙන තිබණි. පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ලබා ගන්නා ලද ගාස්තුවලින් මාර්ගවල පළුදු කරන ලද ස්ථාන ප්‍රතිසංස්කරණය කළයුතු වුවද, විගණන දිනය වූ 2012 ජුන 25 දින දක්වාම එම ස්ථාන ප්‍රතිසංස්කරණය කර නොතිබණි.

(ii) මාර්ග පළුදු කරන ලද ස්ථාන ප්‍රතිසංස්කරණය නොකර, දිගුකාලයක් තිබීමෙන් මාර්ගයට හානි සිදු වී තිබුණි.

### 2.3.4 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

සංයුක්ත සැලැසමක් හා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස් කර නොතිබුණි. ප්‍රසම්පාදන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

### 2.4 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබු අතර විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහ සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) තොග පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය